**දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - (අයි-මාර්ග- II) - 2018**

------------------------------------------------------------------------------------------

දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග II) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළැඹි අංක 3579 එස්ආර්අයි ණය ගිවිසුම සහ අංක 3580 එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුමේ IV වාවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ වැඩසටහනේ කාලය

------------------------------------------------------------------------------------------

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහා මාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සිවිල් වැඩ, උපදේශන කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, උපයෝගික සේවා මාරු කිරීම්, බදු, පොලී සහ කැපකරු කොමිස් යන සංරචක 05 යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 384,382 සමාන එ.ජ.ඩො.මිලියන 1,084.60 ක් වන අතර ඉන් රු.මිලියන 153,000 සමාන එ.ජ.ඩො. මිලියන 900 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 31,382 ක් ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහන එහි කටයුතු 2018 ජූලි 20 දින ආරම්භ කරන ලද අතර 2028 ජූලි 19 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 තත්වාගණනය කළ මතය

-----------------------

මාගේ මතය අනුව, මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැරුණු විට, මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වර්ෂයෙන් අවසන් වූ මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙයි.

## 1.4 මතය සඳහා පදනම

----------------------

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී, මාගේ වගකීම්, එම ප්‍රමිතීන් යටතේ මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පාලනය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමට ඇති හැකියාව තක්සේරු කිරීම, හෙළිදරව් කිරීම් අදාළ වන පරිදි, අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු සහ කළමනාකරණය විසින්

වැඩසටහන ඇවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට අදහස් නොකරන්නේ නම් හෝ යථාර්ථවාදී විකල්පයක් නොමැති නමුත් එසේ කිරීමට සිදුවන්නේ නම්, අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කරමින් ගිණුම්කරණය කිරීම කළමනාකරණයේ වගකීමයි.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳ වගකීම පාලනය සම්බන්ධයෙන් චෝදනා ලද අය සතුවේ.

වැඩසටහන මගින් වාර්ෂිකව හා වරින් වර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා එහි සියලු ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගැනීම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

**2. මුලා‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා වලට අනුව, සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 2,992.16 මුදලක් විය පැහැදම් ගෙවීම් කර තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ මුලා‍ය ප්‍රකාශන තුල අනුරූපී විය පැහැදම් ගෙවීම රු. මිලියන 3,761.08 වටිනාකමකට පෙන්වා තිබුණි. | 768.92 | සැසඳුම් නොකළ ශේෂ | ප්‍රතිචාර දක්වා නොමැත | අනුරූපී සංඛ්‍යා කලින් කල සැසඳුම් කිරීම අවශ්‍ය කෙරේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | | ක්‍රියාකාරකම | 31 .12.2018 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය | 31 .12.2018 දිනට කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීම | විගණන නිරීක්ෂණ | බලපෑම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| සිවිල් වැඩ | (i) | උතුරු, නැගෙනහිර, ඌව සහ බස්නාහිර පළාත්වල කිලෝමීටර් 400 ක ජාතික මාර්ග පුනරුත්ථාපනය කිරීම. | | | ක්‍රියාකාරකම් 2018 දෙසැම්බර් 31 දක්වා ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කාලය දීර්ඝ වීමට සහ කොන්ත්‍රාත්තුවේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව | පැහැදිලි කර නැත |
| | (ii) | උතුරු, නැගෙනහිර, ඌව සහ බස්නාහිර පළාත්වල ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 3,750 ක් පුනරුත්ථාපනය කිරීම | ඌව පළාතේ කිලෝමීටර් 1,048 ක මාර්ග වලින් සියයට 20.7 ක භෞතික කාර්ය සාධනය . | ඌව පළාතේ කිලෝමීටර් 1,048 ක මාර්ගවලින් භෞතික කාර්යසාධනය සියයට 13.8 කි. | 2018 දෙසැම්බර් 31 දිනට අනෙකුත් පළාත්වල මාර්ග පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර නොතිබුණි . | අමතර පොලී සහ කැපකරු ගාස්තු ගෙවීමට සිදු වීම.<br><br>අපේක්ෂිත ප්‍රතිඵලය වන ප්‍රමාදයකින් තොරව නිවැසියන්ට මාර්ගවලට ප්‍රවේශ වීමට ඇති හැකියාව කාලීනව ළඟා කර ගත නොහැකි වීම. | කොන්ත්‍රාත්කරුවන් මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා සහ අහිතකර කාලගුණික තත්ත්වයන් |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** භෞතික ප්‍රගතිය වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇති අතර එසේ නොමැති නම් ගිවිසුම්ගත පියවර ගනු ලැබේ.

**විගණකගේ නිර්දේශය** ඉලක්කගත කාල සීමාව තුළ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් තුළින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පැහැදිලිව හඳුනා ගැනීම අවශ්‍ය වේ.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයට පහසුකම් සැලසීම සඳහා ප්‍රසම්පාදනය කරන ලද උපකරණ රඳවා තබා ගැනීමට කොන්ත්‍රාත්කරුවන්ට අවසර දී ඇති අතර, එහි පිරිවැය පියවා ගැනීම සඳහා රු. මිලියන 87.20 ක මුදලක් එකවර ගෙවීම් පදනමින් වෙන් කර ඇත. | කොන්ත්‍රාත් පිරිවැය අධි තක්සේරුවීම. | කොන්ත්‍රාත් කාලය අවසානයේදී වත්කම්වල හිමිකම කොන්ත්‍රාත්කරුට අයිති වන විට, කොන්ත්‍රාත්කරුවන්ගේ ලංසු මිල සමන්විත වන්නේ නිශ්චිත වත්කම්වල අවශේෂ අගයන් අඩු කිරීමෙනි. එබැවින් ව්‍යාපෘතියට කිසිදු අහිතකර බලපෑමක් සිදු නොවේ. | සාමාන්‍ය සිරිතක් ලෙස අදාළ වත්කම් සේවායයා විසින් රඳවා ගනු ලැබේ. එමනිසා, වෙනත් ආධාර අරමුදල් සපයන ව්‍යාපෘති හා සැසඳීමේදි මෙම වැඩසටහන යටතේ ඇති කොන්ත්‍රාත්තුවේ පිරිවැය අඩු කිරීම අවශ්‍ය කෙරේ. |
| (ආ) වෙනත් අරමුදල් ආධාර ව්‍යාපෘතියක් වන ත්‍රිකුණාමලය ඒකාබද්ධ යටිතල පහුකම් ව්‍යාපෘතිය යටතේ අදාළ මාර්ග කොටස් පුනරුත්ථාපන කටයුතුවල නිරතවී සිටි පූර්ව කොන්ත්‍රාත්කරු විසින් මතු කරන ලද බේරුම්කරණ නඩු සලකා බැලීමකින් තොරව ව්‍යාපෘතිය විසින් නැගෙනහිර පළාත තුළ ත්‍රිකුණාමලය, මඩකලපුව මාර්ගය, ඇලයි කන්ටලායි මාර්ගය සහ මුහුදුබඩ මාර්ග කොටස් පුනරුත්ථාපන වැඩ සඳහා ලංසු කැඳවා ඇගයීම් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් විමසන ලද නීතිමය අවසරය 2018 දෙසැම්බර් 31 දින වන විට පවා ලැබී නොතිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ආරවුලක් පිළිබඳ විය හැක | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව 2019 මැයි 15 දින අවසර ලබා දී තිබුණි. | අතිරේක පිරිවැය වළක්වා ගැනීම සඳහා බේරුම්කරණ අවස්ථා පිළිබඳ ව්‍යාපෘතිය සලකා බැලීම අවශ්‍ය වේ |
| (ඇ) කොන්ත්‍රාත්තුවේ සාමාන්‍යය කොන්දේසියේ 4.2 වන උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරුවන් විසින් ඔවුන්ගේම වියදමින් කාර්යසාධන බැඳුම්කර ලබා දිය යුතුය. කෙසේවෙතත්, ව්‍යාපෘතිය විසින් ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනිව පිරිවැය පියවාගැනීමට ප්‍රමාණ පත්‍ර තුල වෙනම ගෙවීම් අයිතමයක් ඇතුලත් කර තිබුණ අතර කාර්යසාධන බැඳුම්කර සැපයීම මත දරන ලද පිරිවැය පූර්ණය | කොන්ත්‍රාත්කරුවන්ගේ පිරිවැය අධි තක්සේරුවීම. | ඒ අනුව, නැගෙනහිර, උතුරු, බස්නාහිර පළාත්වල කොන්ත්‍රාත් සාමාන්‍ය කොන්දේසි උප වගන්ති 4.2 සංශෝධනය කරන ලද අතර ගෙවීම් අයිතමය ප්‍රමාණ පත්‍ර තුලින් ඉවත් කරන | ලංසු ලියකියවිලි නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥවරයා සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කිරීම කළ යුතුවේ. |

| | |
|---|---|
| කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට ඉඩදී තිබුණ බවට නිරීක්ෂණය විය. ඒ අනුව, ඌව පළාතේ මාර්ග පුනරුත්ථාපන කටයුතු වල නිරතවී සිටි කොන්ත්‍රාත්කරුවන් හට අතිරේකව රු.මිලියන 132.80 ක මුදලක් ගෙවා තිබුණී. | ලදී. |